ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව
**தேசிய தாவரவியல் பூங்காக்கள் திணைக்களம்**
**Department of National Botanic Gardens**
තැ.පෙ. 14, පේරාදෙණිය, ශ්‍රී ලංකාව.
**த.பெ.14, பேராதனை, இலங்கை**
**P.O. Box 14, Peradeniya, Sri Lanka.**

Department of National Botanic Gardens


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේඅංකය<br>எனது இல<br>My No | DNBG/F.15/Pro/2023-45 | ඔබේඅංකය<br>உமது இல<br>Your No | | දිනය<br>திகதி<br>Date | 2023.10.26 |

## ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුවට අයත් 56-8061 දරණ කැබ්රථය අලුත්වැඩියා කිරීම

ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුවට අයත් 56-8061 දරණ කැබ්රථය අලුත්වැඩියා කිරීම සඳහා සීල් තැබූ ලංසුපත් දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන මණ්ඩලයේ සභාපති විසින් භාරගනු ලැබේ. ලංසු කොන්දේසි, පිරිවිතර සහ මිල ගණන් ආකෘති පත්‍රය මේ සමඟ අමුණා ඇති අතර ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුවේ https://www.botanicgardens.gov.lk/bid-invitation/ දරණ නිල වෙබ් අඩවියෙන්ද භාගත කළ හැක. ලංසු කොන්දේසි පත්‍රය මනාව අධ්‍යයනය කොට ඇමුණුම 02 මගින් මිල ගණන් ඉදිරිපත් කළ යුතුය.

02.අදාල පිරිවිතර වලින් යුත් ඔබගේ ලංසු පත් 2023.11.06 වැනි දින පෙ.ව. 11.00 ට පෙර ලැබෙන සේ ලියාපදිංචි කළ තැපැලෙන් පහත ලිපිනයට යොමු කරන්න. ලංසුපත් 2023.11.06 වැනි දින පෙ.ව. 11.00ට විවෘත කරනු ලැබේ.

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන මණ්ඩලය,
ජාතික උද්භිද උද්‍යානය දෙපාර්තමේන්තුව,
තැ.පෙ. 14,
පේරාදෙණිය.

03.ලංසුපත් මෙම දෙපාර්තම්න්තුවේ ප්‍රධාන කාර්යාලයේ තබා ඇති ලංසුපත් බහාලන පෙට්ටිය වෙත අතින් ගෙනවිත් බහාලීමටද පහසුකම් සලසා ඇත. සෑම ලංසුපතක්ම බහාලන කවරයේ වම්පස ඉහල කෙලවර "DNBG/F.15/Pro/2023-45 "**ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුවට අයත් 56-8061 දරණ කැබ්රථය අලුත්වැඩියා කිරීම**" යනුවෙන් සඳහන් කරන්න. ලංසුපත් ඉහත දින නියමිත වේලාවට විවෘත කරන අතර, එම අවස්ථාවට ඔබට හෝ ඔබ විසින් නම් කරනු ලබන නියෝජිතයෙකුට හෝ සහභාගි විය හැක. ඉදිරිපත් කරනු ලබන ලංසු පත් සම්පූර්ණයෙන්ම හෝ ඉන් අඩක් හෝ පිළිගැනීමේ හෝ ප්‍රතික්ෂේප කිරීමේ සම්පූර්ණ බලය ප්‍රසම්පාදන මණ්ඩලයේ සභාපති සතුවන බවද සළකන්න. මේ සම්බන්ධයෙන් වැඩිමනක් තොරතුරු අවශ්‍ය වන්නේ නම් අංක 0812388654 අංකයෙන් ප්‍රධාන ගණකාධිකාරි ඇමතීමෙන් ලබාගත හැකිය.

04. ලංසු ලියවිලි සමඟ ඇති ලංසු සුරක්ෂණ ප්‍රකාශය නිවැරදිව සම්පූර්ණ කර අත්සන් හා නිල මුද්‍රා තබා ඉදිරිපත් කිරීම අනිවාර්යය වේ. නියමිත ලංසු සුරක්ෂණ ප්‍රකාශනයක් ඉදිරිපත් නොකරන ආයතන වල ලංසුපත් ඇගයීමට භාජනය නොකර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

වි.ජී.සී නදීශා ගමගේ
ප්‍රධාන ගණකාධිකාරි
ජාතික උද්භිද උද්‍යාන අධ්‍යක්ෂ ජනරාල් වෙනුවට


| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| කාර්යාලය<br>அலுவலகம்<br>Office | 081-2388654 | ෆැක්ස්<br>தொலை நகல்<br>Fax | 081-2388238 | අධ්‍යක්ෂ ජනරාල්<br>பணிப்பாளர் நாயகம்<br>Director General | 081-2388238 | ඊ-මේල්<br>மின்னஞ்சல<br>E-mail | dirnbg@sltnet.lk |

ඇමුණුම 01

# <u>ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුවට අයත් 56-8061 දරණ කැබරථය අලුත්වැඩියා කිරීම</u>

# ලංසුකරුගේ විස්තර

1. ව්‍යාපාරයේ/ලංසුකරුගේ නම :-

2. ව්‍යාපාරික ලිපිනය :-

3 . දුරකථන අංකය :- ස්ථාවර ජංගම

4. ෆැක්ස් අංකය :-

5. සමාගම් / ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ අංකය හා දිනය (සහතිකයේ පිටපතක් මිල ගණන් සමඟ ඉදිරිපත් කළ යුතුයි)

6. වැට් ලියාපදිංචි අංකය

ඉහත සඳහන් සියළුම තොරතුරු සත්‍ය හා නිවැරදි බවත්, ලංසු කොන්දේසි පත්‍රයේ I කොටසේ සඳහන් අලුත් වැඩියා කිරීමට අදාල පිරිවිතර හා II කොටසේ සඳහන් ලංසු ඉදිරිපත් කිරීමේදී සැලකිය යුතු කරුණු කියවා තේරුම් ගෙන පිලිගෙන් ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුවට අයත් 56-8061 දරණ කැබරථය අලුත්වැඩියා කිරීම අදාල කාර්යයන් සඳහා මිල ගණන් පත්‍රයේ සඳහන් වටිනාකම් වලට අනුව සාර්ථකව ඉටුකල හැකි බව සහතික වෙමි.

දිනය:-.................................

......................................

ලංසුකරුගේ අත්සන හා මුද්‍රාව

ඇමුණුම 02

**ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුවට අයත් 56-8061 දරණ කැබ්රථය**
**අලුත්වැඩියා කිරීමට අදාල පිරිවිතර හා මිල ගණන් ලේඛණය**

| අනු අංකය | විස්තරය | මිල රු. |
|---|---|---|
| 01 | දැනට ආලේප කර ඇති තීන්ත සම්පූර්ණයෙන් ඉවත් කිරීම, අතුරා ඇති මෙටල් ෆිලේර් කපා ඉවත් කිරීම | |
| 02 | සියළුම දිරා ඇති ස්ථාන ඉවත්කොට, අලුතින් පවතින ගේජ සහිත තහඩු යොදා සකස්කර ගැනීම සහ තැලී ඇති සියළුම ස්ථාන දිගහැර මුල් තත්ත්වයෙන්ම සකස් කිරීම (පිටුපස ඩෙක් ඒකකය ඇතුළුව) | |
| 03 | ෆ්ලෝ බෝඩයෙහි දිරා ගිය කොටස් සම්පූර්ණයෙන් ඉවත් කර පවතින ගේජයන් සහිත තහඩු යොදා නියමිත හැඩ නමා පෑස්සීම | |
| 04 | වාහන බොඩිය ප්‍රයිමර්, ෆිලර්, පොටි හෝ හයිෆිලර් අවම ලෙස යොදා මනා ලෙස සකස් කිරීම | |
| 05 | 2Kපේන්ට් තෙවරක් ආලේප කිරීම (තීන්ත භාවිතා කිරීමේදී නිෂ්පාදකයින් විසින් මෙම වාහනය සඳහා ලබා දී ඇති කේත අංකයට අනුව ලබා ගත යුතුය) | |
| 06 | තීන්ත ආලේපයෙන් ආසන්න වශයෙන් මසකට පසු වාහනය සම්පූර්ණයෙන්ම පොලිෂ් කිරීම | |
| 07 | 1.ඉදිරි බෆරය ෆයිබර් කර අලුත්වැඩියාව | |
| | 11.අලුතින් යෙදීම (අවශ්‍ය නම් පමණක්) | |
| 08 | පිටුපස බෆරය ඇඳ ඇර පින්තාරු කිරීම | |
| 09 | වැසියෙහි හා බොඩියෙහි යට ප්‍රදේශවලට පිළිගත් මාදිලියක අන්ඩබොඩි ආලේප කිරීම | |
| 10 | පින්තාරුවේදි ඉදිරිපස වීදුරුව ගැලවීමට සිදු වුවහොත් නැවත සවි කිරීම (බීඩින් සහ ගම් යොදා) - අවශ්‍යනම් පමණක් | |
| 11 | දොර බිඩින්/වීදුරු බීඩින් අලුතින් යෙදීම (අවශ්‍ය නම් පමණක්) | |
| 12. | ෆ්ලෝ කාපට් අලුතින් යෙදීම | |
| 13 | සිග්නල් ලයිට් කප් (ඉදිරි/පසුපස) අලුතින් යෙදීම | |
| 14 | ඩෑෂ් බෝර්ඩ් මීටර් කවරය (ප්ලාස්ටික්) අලුතින් යෙදීම - ඇත්නම් පමණක් | |
| 15 | වාහනය දෙපස පා පුවරු සවි කිරීම (foot rack) | |
| 16 | අඳුනගන්නා ලද වෙනත් දෝෂ සඳහා වන මිල ගණන් (ඇත්නම් පමණක්)<br>1)<br><br>II)<br><br>III) | |
| | මුළු මුදල (රු.) | |
| | වැට් මුදල (අදාල වන්නේ නම් පමණි) (රු.) | |
| | සම්පූර්ණ මුදල (රු.) | |

………………… ……………………………………………

දිනය ලංසුකරුගේ අත්සන හා නිල මුද්‍රාව

ඇමුණුම 03
**(මෙම ආකෘතිය සම්පූර්ණ කිරීම අනිවාර්ය වේ)**

# ලංසු ආකෘති පත්‍රය සහ සුදුසුකම් තොරතුරු

# ලංසු ආකෘති පත්‍රය

අධ්‍යක්ෂ ජනරාල්
ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව
පේරාදෙණිය

මහත්මයාණෙනි,

1. ඉහත නම් කරන ලද කාර්යයන් ක්‍රියාත්මක කිරීම සඳහා එකතු කිරීම පරීක්ෂා කිරීමෙන් අනතුරුව, ඉහත සඳහන් කොන්ත්‍රාත්, උපලේඛන, පිරිවිතර, චිත්‍ර, ප්‍රමාණ සහ අතිරේක බිල්පත්වල දැක්වෙන කොන්දේසිවලට අනුකූලව ශ්‍රී ලංකා මුදලින් රුපියල් ........................................................ක් (................................ (ඉලක්කමෙන්) හෝ තහවුරු කර ගත හැකි වෙනත් මුදලකට අනුකූලව එම කටයුතු ක්‍රියාත්මක කර සම්පූර්ණ කිරීමට සහ එහි යම් අඩුපාඩුවක් නිරාකරණය කිරීමට පහත අත්සන් යොදා ඇති අපි ඉදිරිපත් වෙමු.

2. උපලේඛනය අපගේ ලංසුවේ කොටසක් බව අපි පිළිගනිමු.

3. අපගේ ලංසුව පිළිගනු ලැබුවහොත්, උපලේඛනයේ දක්වා ඇති පරිදි වැඩ ආරම්භ කිරීමට සහ උපලේඛනයේ දක්වා ඇති කාලය තුළ කොන්ත්‍රාත්තුවේ ඇතුළත් සම්පූර්ණ වැඩ නිම කිරීමට අපි භාර ගනිමු.

ලංසුකරුවන්ට උපදෙස්වල **15** වැනි උප වගන්තියේ දක්වා ඇති කාල සීමාව හෝ ඕනෑම දීර්ඝ කාලයක් සඳහා මෙම ලංසුවට අවනත වීමට අපි එකඟ වෙමු. එය අප වෙත බැඳී පවතින අතර එම කාලය අවසන් වීමට පෙර ඕනෑම අවස්ථාවක පිළිගත හැකිය.

1. විධිමත් ගිවිසුමක් සකස් කර මෙම ලංසුව ක්‍රියාත්මක කරන තුරු මිස, එය ඔබගේ ලිඛිත පිළිගැනීම සමඟින්, අප/මා අතර බැඳීම් ගිවිසුමක් සෑදිය යුතුය.

2. ඔබට ලැබිය හැකි අඩුම හෝ ඕනෑම ලංසුවක් පිළිගැනීමට ඔබ බැඳී නැති බව අපි/මම තේරුම් ගනිමු.

මෙම දිනය **2023** ................. මස .......... දින ..................... ධාරිතාවයෙන් .................... වෙනුවෙන් සහ ඒ වෙනුවෙන් ටෙන්ඩර් අත්සන් කිරීමට නිසි බලය ලබා දී ඇත.

අත්සන : ..........................................

ලිපිනය : ..........................................

සාක්ෂි : ..........................................

නිල මුද්‍රාව : ..........................................

ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහ යොමුව: 5.3.12

# ලංසු සුරක්ෂණ ප්‍රකාශය සඳහා ආකෘතිය

දිනය:.........................
කොන්ත්‍රාත් නාමය:ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුවට අයත් අංක 56-8061 දරණ කැබ්රථය අලුත්වැඩියා කිරීම
කොන්ත්‍රාත් හැඳුනුම් අංකය:.......................
ලංසු කැඳවීමේ අංකය :DNBG/F15/Pro/2023-45

අධ්‍යක්ෂ ජනරාල්, ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව
මෙහි පහත අත්සන් කරන අපි මෙසේ ප්‍රකාශ කරමු:

1.ලංසුකරුවනට උපදෙස් අනුව ලංසු සුරක්ෂණ ප්‍රකාශයන් සහිතව ලංසු ඉදිරිපත් කළ යුතු බව අපි දනිමු. මෙහි මින් මතුවට මෙම උපදෙස් “අයිටීබී” වශයෙන් හඳුන්වනු ලැබේ.

2.අප විසින් පහත සඳහන් පරිදි ක්‍රියා කළහොත්, ශ්‍රී ලංකා ජාතික ප්‍රසම්පාදන නියෝජ්‍යායතනය විසින් ප්‍රකාශයට පත් කොට ඇති ප්‍රසම්පාදන මාර්ගෝපදේශවල පැහැදිලිව දක්වා ඇති ඕනෑම කොන්ත්‍රාත්තුවක් පිරිනැමීම, ලංසු භාර ගැනීමට නියම කොට ඇති දිනයෙන් ආරම්භ වන වර්ෂ තුනක කාල සීමාවකට තහනම් කරනු ලැබිය හැකි බව අපි පිළිගනිමු. එනම්:

(අ)නිශ්චය කොට ඇති වලංගු ලංසු කාල පරිච්ඡේදය තුල අප ලංසුව ඉල්ලා අස් කර ගත හොත්; හෝ

(ආ)ලංසුකරුවන්ට උපදෙස් අනුව ලංසු ලේඛණවල වැරදි නිවැරදි කිරීම් පිළි නොගත හොත්; හෝ

(ඇ)අපගේ ලංසුව ප්‍රතිග්‍රහණය කළ බවට ඔබ විසින් දැනුම් දී තිබිය දී, ලංසුව වලංගු කාල පර්ච්ඡේදය තුල අයි ටී බී උපදෙස් ප්‍රකාරව (I) අවශ්‍ය වුවහොත් කොන්ත්‍රාත් ආකෘතිය පිරවීමට අපොහොසත් වුවහොත් කොන්ත්‍රාත් ආකෘතිය පිරවීම ප්‍රතික්ශේප කළහොත් හෝ (II) කාර්යය සාධන සුරක්ෂණය ලබා දීමට අපොහොසත් වුවහොත් හෝ ප්‍රතික්ශේප කළ හොත්.

3.සාර්ථක ලංසුකරු අප නොවේ නම්, (1) ලංසුකරු අසාර්ථක වූ බවට ඔබ විසින් ලංසුකරුට එවන්නාවූ නිවේදනයේ පිටපත ලැබීම නසා හෝ (11) අපගේ ලංසුව ඉදිරිපත් කොට දින විසිඅටක් ගතවීමෙන් පසු මින් පෙරට යෙදෙන කවර අවස්ථාවක හෝ මෙම ලංසු අපේක්ෂා අහෝසි වන බව අපි දනිමු.

4.අප බද්ධ ව්‍යාපාරයක් නම්, ලංසුව ඉදිරිපත් කළ යුත්තේ, එම බද්ධ ව්‍යාපාරික නමින් බව අපි දනිමු.ලංසුව ඉදිරිපත් කරන අවස්ථාවේ දී බද්ධ ව්‍යාපාරය නෛතික වශයෙන් ස්ථාපිත කර නොතිබුණේ නම්, ලංසු අපේක්ෂා ප්‍රකාශය උනන්දු පතෙහි නම් කර ඇති සියලු අනාගත පාර්ශවකරුවන්ගේ නම්වලින් විය යුතු බව අපි දනිමු.

අත්සන් කලේ- තනතුර

නම

ලංසුවට අත්සන් තැබීමට බලය

දිනය...........ක්වූ............මස..............දින

# ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුවට අයත් 56-8061 දරණ කැබ්රථය ලංසු කොන්දේසි පත්‍රය

## I කොටස - අලුත්වැඩියා කිරීමට අදාල පිරිවිතර

1. දැනට ආලේප කර ඇති තීන්ත සම්පූර්ණයෙන් ඉවත් කිරීම, අතුරා ඇති මෙල් පිලේර් කපා ඉවත් කළ යුතුයි.
2. සියළුම දිරා ඇති ස්ථාන ඉවත්කොට,අලුතින් පවතින ගේජ් සහිත තහඩු යොදා සකස් කිරීම සහ තැලී ඇති සියළුම ස්ථාන දිගහැර මුල් තත්ත්වයෙන්ම සකස් කිරීම, ෆ්ලෝ බෝඩයෙහි දිරා ගිය කොටස් සම්පූර්ණයෙන් ඉවත් කර පවතින ගේජයන් සහිත තහඩු යොදා නියමිත හැඩ නමා පෑස්සීම කළ යුතුය.
3. සියළුම ටින්කරින් කටයුතු කිරීමෙන් පසු ප්‍රයිමර් යොදා තීන්ත ආලේපයට පෙර ඉංජිනේරුවරයෙකුගේ / තාක්ෂණ නිලධාරිවරයෙකුගේ පරීක්ෂාවට ලක්කර අනුමැතිය ලබාගත යුතුය.
4. වාහන බොඩිය ප්‍රයිමර්, ෆිලර්, පොටි හෝ හයිෆිලර් අවම ලෙස යොදා මනා ලෙස සකස් කළ යුතුය.
5. 2K පේන්ට් තෙවරක් ආලේප කළ යුතුය. (තීන්ත භාවිතා කිරීමේදී නිෂ්පාදකයින් විසින් මෙම වාහය සඳහා ලබා දී ඇති කේත අංකයට අනුව ලබා ගත යුතුය)
6. තීන්ත ආලේපයෙන් ආසන්න වශයෙන් මසකට පසු වාහනය සම්පූර්ණයෙන්ම පොලිෂ් කළ යුතුය.
7. ඉදිරි බෆරය ෆයිබර් කර අලුත්වැඩියාව/අලුතින් යෙදීම කළ යුතුය.
8. පිටුපස බෆරය ඇඳ ඇර පින්තාරු කිරීම කළ යුතුය.
9. වැසියෙහි හා බොඩියෙහි යට ප්‍රදේශවලට පිළිගත් මාදිලියක අන්ඩබොඩි ආලේප කළ යුතුය.
10. ඉහත කාර්යයන් කිරීමෙන් පසු වාහනය සඳහා අවම වශයෙන් අවුරුද්දක වගකීම් කාලයක් ලබාදිය යුතුය. එම කාලය තුල යම් මලකඩ මතුවුවහොත් හෝ තීන්ත පැල්ලම් ගැලවී යාම් හෝ ඉරි තැලීම් හෝ වර්ණයේ වෙනසක් සිදුවුවහොත් ඒ සම්බන්ධයෙන් අය කිරීමකින් තොරව අඩුපාඩු සකස් කොට නැවත පින්තාරු කිරීමට එකඟ විය යුතුය.
11. පින්තාරුවේදී ඉදිරිපස වීදුරුව ගැලවීමට සිදු වුවහොත් නැවත සවි කිරීම කළ යුතුය. (බීඩින් සහ ගම් යොදා)
12. පින්තාරුවේදී ගැලවෙන වයරින් පද්ධතියට අයත් කොටස් පින්තාරුවෙන් පසු නැවත නොමිලේ සැකසීම කළ යුතුය.
13. දොර බීඩින්, වීදුරු බීඩින් අලුතින් යෙදීය යුතුය. (අවශ්‍යනම් පමණක්)
14. ෆලෝ කාපට් /බකට් කාපට් අලුතින් යෙදීම කළ යුතුය.
15. ඉහත පිරිවිතරයෙහි දක්වා ඇති වැඩ සම්පූර්ණ කර මාස 02ක් ඇතුලත වාහනය දෙපාර්තමේන්තුවට භාරදිය යුතුය.
16. ඉහත සඳහන් අලුත්වැඩියාවන්ට අමතරව ස්ථානීය පරීක්ෂාවේදී වාහනය නිරීක්ෂණය කිරීමෙන් ඔබ විසින් හඳුනාගන්නා ලද වෙනත් සිදුකලයුතු අලුත් වැඩියාවන් ඇත්නම් විස්තර සහිතව ඒ සඳහා මිල ගණන් ඉදිරිපත් කිරීම.

## <u>II කොටස - ලංසු ඉදිරිපත් කිරීමේදී සැලකිය යුතු කරුණු</u>

1. ඒ ඒ පිරිවිතරයන්ට අදාලව සියලු තොරතුරු ඇතුලත් මිල ගණන් පත් එවිය යුතුය.
2. ලංසු ආකෘති පත්‍රයේ මුළු සැපයුම සඳහා වන වටිනාකම සඳහන් කර ඉදිරිපත් කිරීම අනිවාර්ය වේ.
3. ලංසු සුරක්ෂණ ප්‍රකාශය ඉදිරිපත් කිරීම අනිවාර්යය වේ.
4. මිල ගණන් ඉදිරිපත් කිරීම සම්බන්ධව තවත් තොරතුරු ඉදිරිපත් කිරීමට අවශ්‍ය නම් ආයතනයේ ලිපි ශීර්ෂයෙන් අත්සන ,නිලමුද්‍රාව හා දිනය ඇතුලත් ලිපියක් මඟින් ඉදිරිපත් කළ හැක.
5. ලංසුපත් සමඟ අනෙකුත් තොරතුරු ඉදිරිපත් කිරීමේදී ඔබගේ ලියාපදිංචි අංකය ඇතුලත් ලිපි ශීර්ෂ වල පමණක් එවිය යුතු අතර, ඉලක්කම් වෙනස් කරන්නේ නම් ඒ ස්ථාන වල කෙටි අත්සන් යෙදිය යුතුය.
6. ටිපෙක්ස් භාවිතය ඉදුරාම තහනම්ය.
7. සෑම ලංසු පතකම මිල ගණන් පැහැදිලිව ඉලක්කමෙන් සඳහන් කර ආයතනයේ නිල මුද්‍රාව තබා අත්සන් කළ යුතුය.
8. මෙයට පෙර රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන සඳහා සැපයුම් ලබාදී ඇත්නම් එම තොරතුරු සනාථ කිරීමට අදාල තොරතුරු හා මිල ගණන් ඉදිරිපත් කරන්න. ඇගයීමේදී මේ පිළිබඳව සලකා බලනු ලැබේ.(ආසන්න වශයෙන් වසර 02 ක ආයතන 02 ක් සඳහා සිදුකර ඇති සැපයීම් පිළිබඳ තොරතුරු ඉදිරිපත් කිරීම ප්‍රමාණවත් වේ)
9. දේශීය ආදායම් කොමසාරිස් විසින් මෙතෙක් පනවා ඇති හා ඉදිරියට පනවනු ලබන සියලුම බදු මුදල් වලට ඔබ යටත් වන බවත් මිල ගණන් සියලු බදු ඇතුලත්ව ඉදිරිපත් කළ යුතු බවත් සලකන්න. වැට් බදු වෙනම ලංසු මිල ගණන් පත්‍රයේ දක්වා ඇති පරිදි සඳහන් කළ යුතුය.
10. ආකෘතියේ මිල ගණන් වලංගු වන කාලය සීමාව සඳහන් කිරීම අනිවාර්යය වේ.
11. වැට් බදු ඉල්ලුම් කරන්නේ නම් භාණ්ඩ සැපයීමෙන් පසු බිල්පත් හා වවුචර් සමඟ වලංගු වැට් ලියාපදිංචි සහතිකයක් ඉදිරිපත් කළ යුතුය.
12. මිල ගණන් බහා එවන කවර වල විවෘත කල හැකි ස්ථාන සීල් තබා නිල මුද්‍රාව තබා එවීමට කටයුතු කළ යුතුය.
13. ලංසුපත් බහාලන කවරයේ වම්පස පහළ කෙලවරේ ලංසුකරුගේ නම හා ලිපිනය සඳහන් කිරීම අනිවාර්ය වේ.
14. ලංසු ඉදිරිපත් කිරීමට පෙර පේරාදෙණිය, ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුවට පැමිණ **56-8061 අංක දරණ වාහනය පරීක්ෂා කර බලා මිල ගණන් ඉදිරිපත් කළ යුතුය.** ඒ සඳහා පහත අංක අමතා අදාල නිළධාරීන් මඟින් දිනයක් හා වේලාවක් වෙන් කර ගැනීමට ඔබට හැකියාව ඇත.
    - ආචාර්ය අචලා අත්තනායක මිය<br>අධ්‍යක්ෂ (තාක්ෂණ, ප්‍රචාරණ හා පර්යේෂණ) – 071-4890693
    - පවිත්‍රා රූපසිංහ මිය<br>නියෝජ්‍ය අධ්‍යක්ෂ (පාලන) – 071-9209741
    - ඩී.පී. සමන්ත කුමාර මයා<br>කළමණාකරණ සේවා නිළධාරි (වාහන නඩත්තු) – 071-4289100
15. **මේ සමඟ අමුණා ඇති ලංසු සුරක්ෂණ ප්‍රකාශය නියමිත පරිදි සම්පූර්ණ කර අත්සන්, නිලමුද්‍රා තබා එවීම අනිවාර්ය වේ.**
16. **ස්ථානීය පරීක්ෂාව සිදු කළ බවට සහතිකය නියමිත පරිදි අත්සන් නිලමුද්‍රා තබා ලංසු ලේඛණ සමඟ ඉදිරිපත් කිරීම අනිවාර්යය වේ.**

සභාපති,<br>
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන මණ්ඩලය,<br>
ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව,<br>
පේරාදෙණිය.<br>
2023.10.26